# ජාතික ජලජ සම්පත් නියෝජිතායතනය

# தேசிய நீரியல்வள முகாமை

# NATIONAL AQUATIC RESOURCES AGENC

# 1981

## වාර්ෂික වාර්තාව සහ ගිණුම්

## வருடாந்த அறிக்கையும் கணக்கும்

## ANNUAL REPORT AND ACCOUNTS

# 1981 වාර්ෂික වාර්තාව

1981 අංක 54 දරණ (1981 සැප්තැම්බර් 2 වන දින සහතික කරන ලද) පාර්ලිමේන්තු පනතක් මගින් ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය පිහිටුවන ලද අතර, එය ජලජ සම්පත් විෂයය පිළිබඳ පර්යේෂණ සංවර්ධන හා කළමනාකරණ කාර්යයන් කරගෙනයාමේ හා සමායෝජනය කිරීමේ වගකීම පැවරුණු ප්‍රධාන ජාතික ආයතනය වේ.

ඇමතිවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයින් අට දෙනෙකුගෙන් ද ධීවර අමාත්‍යාංශයේ ලේකම්, කර්මාන්ත හා විද්‍යාත්මක කටයුතු, මුදල් අමාත්‍යාංශවල නියෝජිතයින් සහ නියෝජිතායතනයේ අධ්‍යක්ෂ ජනරාල් ඇතුලත්වන නිලබලයෙන් පත්වන සාමාජිකයින් හතර දෙනෙකුගෙන් ද සමන්විතවන පාලන මණ්ඩලයකට මේ නියෝජිතායතනයේ බලතල හා රාජකාරි පැවරී තිබේ.

නියෝජිතායතනයේ වාර්ෂික වැඩ සටහන හා [illegible] පිළිබඳව පාලක මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරන්නාවූ ද අනුමත පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය අධීක්ෂණය කරන්නාවූද, විද්‍යාත්මක හා තාක්ෂණික කමිටුව නමින් හැඳින්වෙන නියෝජිතායතනයේ ස්ථාවර කමිටුවක් සංස්ථාපනය කිරීම සඳහා ද පනතින් විධිවිධාන සැලසේ.

පහත දැක්වෙන කාර්යයන් ඉටු කිරීම සඳහා ජාතික ජලජ සම්පත් කළමනාකරණ මණ්ඩලයක් සඳහා ද පනතින් විධිවිධාන සලසා ඇත.

අ. ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් කළමනාකරණය හා සංවර්ධනයට අදාල කරුණු පිළිබඳව ඇමතිවරයාට උපදෙස් දීමට හා නිර්දේශ ඉදිරිපත් කිරීමට හා

ආ. සම්පත් කළමනාකරණ සංවර්ධන හා සම්පත් සැලැස්ම පිළියෙළ කිරීමට හා නිරන්තර සමාලෝචනය යටතේ තැබීම.

නියෝජිතායතනය පාලක මණ්ඩලය විසින් රැස්වීම් 7 ක් පවත්වන ලද අතර, ඉන් පළමුවන රැස්වීම්වලදී සාකච්ඡා කරනු ලැබූ වඩා වැදගත් කරුණුවලින් සමහරක් මෙසේවිය:-

(1) සේවක මණ්ඩලය බඳවා ගැනීම හා මත්ස්‍ය තාක්ෂණික ආයතනයෙන් ධීවර අමාත්‍යාංශයේ පර්යේෂණ අංශයෙන් සේවයෙහි නියුතු අයට නියෝජිතායතනය රැකියාව විධිමත්පරිදි පිරිනැමීම.

(2) බඳවා ගැනීමේ කාර්ය පරිපාටි සාකච්ඡාව

(3) ජලජ සම්පත්වලට අදාල ක්‍රියාකාරීත්වයන්ගේ විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳ වාර්ෂික සමාලෝචනයක් කර එය තීරණ කරන්නට සම්මත ප්‍රභවයක් ලෙස ප්‍රයෝජනවත් වන පරිදි වාර්ෂික ග්‍රන්ථයක් ආකාරයෙන් සකස් කිරීම.

(4) සාගර විද්‍යාව පිළිබඳ ඉන්දියානු ජාතික ආයතනය (     එන්.අයි.ඕ) සමග සාකච්ඡා පවත්වා කාරාආයතනයේ විද්‍යාඥයින්ට ඉන්දියානු යාත්‍රාවල සේවයකළහැකිවූන : පරිදි සහයෝගිතා වැඩ සඳහා විධිවිධාන සලසාලීම.

ආචාර්ය හිරාන් ඩබ්ලිව් ජයවර්ධන
සභාපති.
1983.03.03

විගණකාධිපති දෙපාර්තමේන්තුව,
ටොරිංටන් චතුරශ්‍රය, කොළඹ 7, ශ්‍රී ලංකාව.
1984 මාර්තු 22 වැනි දින.

මගේ අංකය: සී-13(බී)/එන්ඒආර්ඩී/81.

සභාපති,
ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන-
නියෝජිතායතනය.

**ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයෙහි 1981 සැප්තැම්බර් 16 වැනි දින සිට දෙසැම්බර් 31 වැනි දින දක්වා කාලය සඳහා ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව.**

ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජ්‍යායතනයෙහි 1981 සැප්තැම්බර් 16 වැනි දින සිට දෙසැම්බර් 31 වැනි දින දක්වා කාලය සඳහා ගිණුම් පිළිබඳ විගණනය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව අනුව ම විසින් පවත්වන ලදී.

විගණනය පිළිබඳ මාගේ නිරීක්ෂණ පහත සඳහන් ඡේදවල දැක්වේ.

1:1 <u>හැඳින්වීම:</u>

ජාතික ජලජ සම්පත්, පර්යේෂණ සහ සංවර්ධන නියෝජ්‍යායතනය, 1981 අංක: 54 දරණ පනත යටතේ පිහිටුවන ලදී. ඇමතිවරයා විසින් පත්කරන ලද සාමාජිකයන් අට දෙනෙකුගෙන්ද, නිල බලයෙන් පත්වන සාමාජිකයින් හතර දෙනෙකුගෙන් ද යුතු පාලන මණ්ඩලයකට නියෝජ්‍යායතනයේ බලතල සහ රාජකාරිය පැවරේ. මේ සියළු දෙනාගේම නිල කාලය අවුරුදු දෙකකි. ප්‍රථම පාලන මණ්ඩලයේ සාමා ජිකයින්ගේ නිල කාලය 1981 සැප්තැම්බර් 16 වැනි දින ආරම්භ විය. පනතේ 1 වැනි වගන්තිය යටතේ ඇමතිවරයා විසින් පනවන ලද නියෝගය ප්‍රකාරව නියෝජ්‍යායතනය සිය මෙහෙයුම් ආරම්භ කළ දිනය ද මෙයම විය.

මණ්ඩලයේ පරිපාලන කාර්යයන් ඉටු කිරීම සඳහා ඇමතිවරයා විසින් අධ්‍යක්ෂ ජනරාල් වරයෙක් පත්කරනු ලැබීමද, මණ්ඩලයට ලේකම්වරයෙකු පත් කිරීමද පනතින් ප්‍රතිපාදනය වේ. ඇමතිවරයා වෙත උපදෙස් දීමටත්, නිර්දේශ කිරීමටත්, ජාතික ජලජ සම්පත් ඇගයීමටත් කළමණාකරණ සභාවක් පිහිටුවීම සඳහාත්, පර්යේෂණ හා සංවර්ධනය පිළිබඳ යෝජනා ලැබීමටත්/ මණ්ඩලයට නිර්දේශ කිරීමටත් විද්‍යාත්මක සහ තාක්ෂණික කමිටුව නම් වූ නියෝජ්‍යායතනයට අයත් ස්ථාවර කමිටුවක් පිහිටුවීම සඳහාත් පනතින් ප්‍රතිපාදනය වේ.

1:2 <u>ගිණුම් ඉදිරිපත් කිරීම:</u>

1981 සැප්තැම්බර් 18 වැනි දින සිට දෙසැම්බර් 31 වැනි දින දක්වා කාලය සඳහා ගිණුම් ඉදිරිපත් කරමින් 1982 සැප්තැම්බර් 10 වැනි දින අධ්‍යක්ෂ ජනරාල් මා වෙත ලිපියක් එවූ නමුදු කාල පරිච්ඡේදයක් සඳහන් නොවූ එකී ගිණුම් වලට අත්සන් තැබීම ද සිදුකොට නොතිබුණි.

/2....

1981 ඔක්තෝබර් 16 වැනි දින සිට දෙසැම්බර් 31 වැනි දින දක්වා කාලයට අදාළවන්නාවූ ද, නිසි අයුරු අත්සන් කලාවූද තවත් ගිණුම් කට්ටලයක් 1983 ජනවාරි 25 වැනි දින ලැබිනි. තවදුරටත් කරුණු පැහැදිලි කරන ලෙස ඉල්ලූ විට, පාලන මණ්ඩලයේ ලේකම් 1983 සැප්තැම්බර් 09 වැනි දින දරණ සිය ලිපියෙන් මට මෙසේ දැන්විය.

" නියෝජ්‍යායතනයේ පාලන මණ්ඩලය සහ එහි මෙහෙවුම් ආරම්භ කිරීමේ නියමිත දිනය වශයෙන් 1981 සැප්තැම්බර් 16 වැනි දිනය. ගරු ධීවර ඇමතිවරයා විසින්, 1981 සැප්තැම්බර් 09 වැනි දින සහ අංක. 157/5 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත්කරන ලදී. ගැසට් පත්‍රයේ ප්‍රකාශිත 1981 සැප්තැම්බර් 16 වැනි දින හැර වෙනත් දිනයක් ගරු ධීවර ඇමතිවරයාගේ දැන්වීමේ ප්‍රතිපාදනයන්ට අනුකූල නොවන බැවින් ගණක කාල පරිච්ඡේදය 1981 සැප්තැම්බර් 16 වැනි දින ආරම්භ වී 1981 දෙසැම්බර් 31 වැනි දින අවසන් වී යැයි සැළකිය හැකියි."

2. ගිණුම්.

2.1 විගණන මතය:

ඉදිරිපත්කොට තිබෙන ගිණුම් සාමාන්‍යයෙන් පිළිගත් ගණන මූලධර්ම පදනම්ව සතුටුදායකව සකස් කොට ඇතැයි, පහත සඳහන් 2.5 ඡේදයෙහි දැක්වෙන අදහස් දැක්වීම් හේතුකොට ගෙන මා හට මතයක් ප්‍රකාශ කළ නොහැකියි.

2:2 මුදල්මය ප්‍රතිඵල:

ඉදිරිපත් කොට තිබෙන ගිණුම් අනුව, 1981 සැප්තැම්බර් 16 වැනි දින සිට 1981 දෙසැම්බර් 31 වැනි දින දක්වා කාල පරිච්ඡේදය සඳහා නියෝජ්‍යායතනයේ වැඩ කටයුතු වලින් වියදම් ඉක්මවූ රු.2,35,067 ආදායම් අතිරික්තයක් උද්ගත විනි. සමාලෝචිත කාල පරිච්ඡේදය සඳහා මුදල්මය ප්‍රතිඵල පහත සඳහන් ප්‍රකාශයෙන් දැක්වේ.

| | 1981 සැප්තැම්බර් 16 වැනි දින සිට දෙසැම්බර් 31 වැනි දින දක්වා කාලය. | |
|---|---|---|
| | රු: | රු: |
| භාණ්ඩාගාරයේ ලැබීම් | | 9,53,000 |
| අඩුකලා: වියදම | | |
| වැටුප් සහ වේතන | 4,15,728 | |
| මණ්ඩලීය වියදම් | 12,948 | |
| ගොඩනැගිලි, රථවාහන, යන්ත්‍රසූත්‍ර, ලී බඩු ආදිය නඩත්තු කිරීම | 1,61,336 | |
| විදුලි බලය | 60,000 | |
| වෙනත් වියදම් | 67,921 | 7,17,933 |
| වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය | | 2,35,067 |

2.3 මුදල්මය ව්‍යුහය:

1981 දෙසැම්බර් 31 වැනි දිනට නියෝජ්‍යායතනයේ මුදල්මය ව්‍යුහය පහත දැක් වේ.

| | රු: | රු: |
|---|---|---|
| **සම්පත්:** | | |
| රජයේ දායකය | | 61,81,000 |
| වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය | | 2,35,067 |
| | | 64,16,067 |
| **උපයෝජනය:** | | |
| පිරිවැයට ස්ථාවර වත්කම් | | 19,290 |
| ජංගම වත්කම් | 65,42,614 | |
| **අඩුකළා:** | | |
| ජංගම ණය බැරකම් | 1,45,837 | 63,96,777 |
| | | 64,16,067 |

2.4. අරමුදල් ප්‍රභවය සහ ඒවා යෙදවීම:

සමාලෝචිත කාලය තුළ නියෝජ්‍යායතනයේ අරමුදල් ප්‍රභවය සහ ඒවා යෙදවීම පහත සඳහන් ප්‍රකාශයෙන් දැක්වේ.

| | | රු: |
|---|---|---|
| **ප්‍රභවය:** | | |
| රජයේ දායකය | | 61,81,000 |
| වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය | | 2,35,067 |
| | | 64,16,067 |
| **යෙදවීම:** | | |
| ස්ථාවර වත්කම් මිළදී ගැනීම | | (19,290) |
| පහත ලැයිස්තු ගතකොට තිබෙන අයුරු කාරක ප්‍රාග්ධනය | | 63,96,777 |
| අතැති සහ බැංකුගත මුදල් | 64,81,139 | |
| ණයගැතියෝ | 14,600 | |
| සපයන්නාට දුන් අත්තිකාරම් | 46,875 | |
| ණය හිමියෝ | (4,110) | |
| උපචිත වියදම් | (1,41,727) | 63,96,777 |

/4.....

## 2,5 ගිණුම් පිළිබඳව අදහස් දැක්වීම්:

### 2.5.1 අමාත්‍යාංශයෙන් වත්කම් පැවරීම:

මත්ස්‍ය තාක්ෂණ ආයතනයට සහ ධීවර අමාත්‍යාංශයේ පර්යේෂණ අංශයට කලින් අයත්ව තිබුණු සියළුම දේපොල මෙම නියෝජ්‍යායතනයට අයත්ව පවතින බැව් කියනු ලැබේ. කෙසේ වෙතත්, මෙම දේපොල නියෝජ්‍යායතනයට පැවරීම් පනතේ 35 වැනි වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාවේ දිනය තෙක් ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලැබ නොමැතිය. 1978 දෙසැම්බර් 19 වැනි දින සහ අංක:842 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව මෙම වත්කම් අගයා ගිණුම්ගත කළයුතුව තිබිණි.

### 2:5:2 නියෝජ්‍යායතනයේ අරමුදල:

පාර්ලිමේන්තුවෙන් සම්මත මුදල්, මෙහෙයුම් ආදායම, ත්‍යාග, පරිත්‍යාග ආදිය ලැබීමට සහ දැරූ වියදම් ගෙවීමට නියෝජ්‍යායතනයට එහි අරමුදලක් තිබිය යුතු බැව් පනතේ 29 වන වගන්තියෙන් ප්‍රකාශ වේ.

1981 දෙසැම්බර් 31 වැනි දින තෙක් රජයෙන් ලද රු:71,34,000 ක් වූ සම්පූර්ණ ප්‍රදානයෙන් රු:9,53,000 ක් ආදායම වශයෙන් ද, ඉතිරි රු: 61,81,000 රජයේ දායකවීමක් වශයෙන් ද නියෝජ්‍යායතනයෙන් සළකා තිබිණි. මෙයට මුල්වූ හේතුව විගණනයෙන් නිශ්චය කළ නුහුණි.

පනතේ 30 වැනි වගන්තිය ප්‍රකාරව අරමුදලෙන් ආයෝජනය කිරීමට හෝ ආපසු ලබා ගැනීමට හෝ මණ්ඩලයෙන් රෙගුලාසි සකස්නොට නැත. කෙසේ වෙතත්, අතුරු කාල පරිච්ඡේදය සඳහා මුදල් රෙගුලාසි සහ ආයතන සංග්‍රහය අනුගමනය කිරීමට, 1981 නොවැම්බර් 20 වැනි දින පැවැත්වූ මණ්ඩලයේ රැස්වීමකදී තීරණය කොට තිබිණි.

### 2.5.3 ලෙජරය පවත්වා ගැනීම:

(අ) 1981 දෙසැම්බර් 31 වැනි දිනට ශේෂ පිරික්සුම නිෂ්කර්ෂණය කිරීම හෝ ලෙජරයතුලනය කිරීම හෝ සිදුකොට නොතිබිණි.

(ආ) ලෙජරයේ දැක්වූ ශේෂයන්, ගිණුමට යාකොට තිබෙන ප්‍රකාශයේ දැක්වූ ශේෂයන්ට වඩා වෙනස් වූ බැවින් පහත සඳහන් අයිතමයන් සතුටුදායකව සන්නිරීක්ෂණය කිරීම හෝ විගණනයෙන් පිළිගැනීම හෝ කළ නුහුණි.

| ගිණුම | ලෙජරය අනුව ශේෂය රු: | ප්‍රකාශය අනුව ශේෂය රු: |
|---|---|---|
| වැටුප් සහ වේතන | 3,44,417 | 3,42,659 |
| අතිකාල | 5,642 | 5,709 |
| උපචිත වියදම් | 4,264 | 1,[illegible]1,727 |

2.5.4 උපලේඛන.

ගිණුම් හි දක්වා පහත සඳහන් අයිතමයන් පිළිබඳ සවිස්තර උපලේඛන විගණනයට සපයා නොතිබිණි.

| අයිතමය | අගය |
|---|---|
| | රු: |
| ණය ගැතියෝ, සේවකයෝ | 14,600 |
| සපයන්නාට අත්තිකා රම් | 46,875 |
| ණය හිමියෝ | 4,110 |

2.5.5 ණයගැති සහ ණය හිමි ශේෂ සනාථ කිරීම.

ගිණුම් හි දක්නා ණයගැතියන් සහ ණය හිමියන් පිළිබඳ ශේෂ සම්බන්ධයෙන් සනාථ කිරීම් කැඳවා නොතිබිණි.

2.5.6 මණ්ඩලයේ සාමාජිකයින්ගේ පාරිශ්‍රමික:

නියෝජ්‍යායතනය විසින් පාලන මණ්ඩලයේ සාමාජිකයන්ට එක් රැස්වීමකට රු.100 බැගින් වූ දීමනාවක් ගෙවනු ලැබ තිබිණි. ඇමතිවරයා විසින්, පනතේ 20 වැනි වගන්තිය ප්‍රකාරව, මෙම පාරිශ්‍රමිකය නිශ්චය කරනු ලැබූ බවක් නොපෙනිණි.

දීමනාව වැඩි කරන ලෙස ඉල්ලීමකට පිළිතුරු වශයෙන් ධීවර අමාත්‍යාංශයෙන් 1982 අප්‍රේල් මාසයේදී ලැබුණ ලිපිකයට මගේ අවධානය යොමු කළ අධ්‍යක්ෂ ජනරාල් වරයා මට දැන්වූයේ අමාත්‍යවරයා රු.100 අනුමත කළ බව ඉන් අදහස් වන නමුදු අදාල ලියවිලි වහාම ලබා ගැනීමට නොතිබුණ බවයි.

2.5.7 අමාත්‍යාංශයීය කාර්ය මණ්ඩලයට මුදල් ගෙවීම්.

ධීවර අමාත්‍යාංශයේ නිලධාරීන් සතර දෙනෙකුට 1981 සැප්තැම්බර් සිට රු.250 සිට රු.750 දක්වා වූ ප්‍රමාණ අනුව මාසික දීමනා ගෙවා තිබිණි.

මෙම නිලධාරීන් ගේ සේවා යෙදවීම සහ ඊට මුදල් ගෙවීම සඳහා වූ ආයතන අධ්‍යක්ෂ වරයාගේ අධිකාර බලය විගණන සත්‍යාපනය සඳහා ලබා ගැනීමට නොවීය.

2.5.8 රක්ෂණය:

ගිනි ගැනීම් ආදී වූ අනතුරු සඳහා නියෝජ්‍යායතනයේ වත්කම් රක්ෂණය කොට නොතිබිණි.

2.5.9 සේවා පිරිස්.

ධීවර අමාත්‍යාංශයේ පරීක්ෂණ අංශයට සහ මත්ස්‍ය තාක්ෂණ ආයතනයට අනුයුක්තව සිටි සේවා පිරිස්, 1981 ඔක්තෝබර් මස සිට නියෝජ්‍යායතනයේ සේවයට අන්තර්ග්‍රහණය කොට තිබුණ බැව් විගණනයේදී හෙළිවිනි. කෙසේ වෙතත්, කාර්ය මණ්ඩලය අන්තර්ග්‍රහණය කිරීමේ දී පනතේ 24 වැනි වගන්තියේ සහ ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 6 වැනි

/ 6.....

වගන්තියේ නියමකොට දක්වා තිබෙන කාර්ය පරිපාටිය අනුගමනය කල බවක් දැක්වීමට සාක්ෂි නොවීය. මෙම නිසා, රු: 3,80,159 ක්වූ වැටුප් සහ වේතන පිළිබඳ වියදම විගණනයේදී සෑහීමකට පත්විය හැකි අයුරු සන්නිරීක්ෂණය කිරීම හෝ පිළිගැනීම හෝ කළ නුහුණි.

1983 නොවැම්බර් මාසයේදී අධ්‍යක්ෂ ජනරාල් වරයා මට පහත දැක්වෙන අයුරු දැන්වීය. "මත්ස්‍ය තාක්ෂණ සහ පර්යේෂණ යන අංශ දෙකට අනුයුක්තව සිටි කාර්ය මණ්ඩලය "නාරා" ආයතනයට ද්විතීයනය කළ බැවින්, ඔව්හූ "නාරා" ආයතනයේ කාර්ය මණ්ඩලයේ හරය වූහ. ද්විතීයනය කළ පසු, තනතුරු නැතිකර දැමීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සමඟ කටයුතු කරන ලදී. කෙසේ වෙතත්, ඔවුන්ගේ තනතුරු නැතිකර දැමීමේ කටයුතු නිශ්චය කිරීමට පෙර නියෝජ්‍යායතනය යටතේ වූ රැකියා නියම සහ කොන්දේසි අනුව ඔවුන්ට රැකියා සපයන ලදී. 1982 පෙබරවාරි 01 වැනි දින සිට තනතුරු නැති කිරීමත් සමඟ සියළුම නිළධාරිහූ ඔවුන්ගේ පත්වීම් භාරගත්හ. එමනිසා නිලධාරීන් පත්කළා මිස අන්තර්ග්‍රහණය නොකළ බැවින් පනතේ 24 වැනි වගන්තියෙන් නියම කොට තිබෙන කාර්ය පරිපාටිය පිළිබඳ ප්‍රශ්ණයක් පැන නොනගින බැව් පෙනී යනු ඇත."

2.5.10 <u>වෙනත් ඌණතාවන්:</u>

(අ) <u>ගොඩනැගිලි නඩත්තු කිරීම</u>

මෙම අයිතමය යටතේ පෙන්වා තිබෙන වියදමට රු:1,36,213 මුදලක් අන්තර්ගත වේ. මෙම මුදල ප්‍රාග්ධනගත කළ යුතුවූ ප්‍රාග්ධන අයිතමයන් අත්කර ගැනීමේ පිරිවැයයි.

(ආ) <u>හිමිකම් නොපෑ වැටුප්.</u>

සඳහා
රු.1,758 ක්වූ හිමිකම් නොපෑ වැටුප්/ගිණුම්ගී ප්‍රතිපාදනය කොට නොතිබිනි.

## 3. <u>මුදල්මය සහ මෙහෙයුම් සමාලෝචනය:</u>

ගිණුම් අනුව, ආරම්භක දිනයේ සිට ආසන්න වශයෙන් මාස 3 1/2 කාලයක් (එනම්, 1981 සැප්තැම්බර් 16 වැනි දින සිට දෙසැම්බර් 31 වැනි දින දක්වා) සඳහා නියෝජ්‍යායතනය වෙත වියදම ඉක්මවූ රු.2,35,067 ආදායම් අතිරික්තයක් විය. රජයේ මුළු ප්‍රදානය වූ රු.71,34,000 න් රු.9,53 000 ක් ආදායම වශයෙන් නියෝජ්‍යායතනයෙන් සැළකිල්ලට ගෙන ඉහත කී මුදල්මය ප්‍රතිඵල වෙත එළඹී ඇත.

සමාලෝචිත කාලය තුළදී නියෝජ්‍යායතනය ව්‍යවෘතව සිටියේ ප්‍රධාන වශයෙන්ම ආයතන සහ පරිපාලන කටයුතු පිළිබඳවයි.

## 4. <u>පද්ධති සහ පාලන:</u>

(1) <u>අධිකාර බලය පැවරීම:</u>

මුදල්මය පාලනය සහ කළමණාකරණය සඳහා මණ්ඩලය සිය අධිකාර බලය සහ කටයුතු මෙම නියෝජ්‍යායතනයේ නිලධාරීන්ට විධිමත්ව පැවරූ බව සාක්ෂි නොවීය.

/7.....

(II) ඇප.

අත්මුදල්, චෙක්පත්, ගබඩා බඩු බාහිර සහ වෙනත් වත්කම් ගැන කටයුතු කරන නිලධාරීන් විසින් ඇප ඉදිරිපත් කළයුතු බවට නියෝජ්‍යායතනය නියමය කොට නොතිබිණි.

(III) අභ්‍යන්තර පාලනය:

වර්ෂය අවසානයේදී ණය බැරකම් නිශ්චය කිරීම ද, ගණක ලියවිලි සහ අභිලේඛණ සකස්කොට පවත්වා ගැනීමද, අත්මුදල් සහ වෙනත් වත්කම්ද පිළිබඳව අභ්‍යන්තර පාලන පද්ධතිය දුර්වලව පැවති බැව් පෙණිනි. කාර්ය පරිපාටි සහ නියෝජ්‍යායතනයේ විවිධ, සේවා පිරිස් වෙත කාර්ය පැවරීම පිළිබඳ සවිස්තර සැලැස්මක් තිබී නැත. විගණනය කිරීමේ දී දුටු ඌණතාවයන් පහතින් දැක්වේ.

(අ) අත්මුදල්:

1981 ඔක්තෝබර් මාසය සඳහා වූ හිමිකම් නොපෑ වැටුප් මාස 02 ක් ගෙවීම් නිලධාරියා වෙත තිබිණි. වර්ෂය අවසානයට වූ සුළු මුදල් ශේෂ ආපසු ගෙවීම හෝ වගකිවයුතු නිලධාරියකු විසින් සත්‍යායනය කරනු ලැබීම හෝ සිදුකොට නොතිබිණි. විශේෂ කාර්යයන් සඳහා දුන් අත්තිකාරම් මුදල් මාස 1 1/2 ට වැඩි කාලයක් බේරුම් නොකොට තිබිණි. ඉල්ලුම් කල යම් අවස්ථාවන්හිදී සුළු මුදල් අග්‍රිම ගණනාවක්ම ප්‍රදානය කොට තිබිණි. එහෙත් උපරිම සීමාවන් නියම කළ පදනම විගණන පරීක්ෂාව සඳහා ලබා ගැනීමට නොවීය. නියෝජ්‍යායතනයේ මුදල් අවශ්‍යතාවය නියම වශයෙන් නිශ්චය නොකොට භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලබාගෙන තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂය අවසානයේදී අග්‍රිමයෙන් විශාල ප්‍රමාණයක් වියදම් නොවී තිබිණි.

(ආ) වෙනත් වත්කම්:

නිසි පාලනයක් සහ කාර්යක්ෂම උපයෝජනයක් පවතිනු ඇති බවට වගබලා ගැනීම සඳහා ස්ථාවර වත්කම් ලේඛන සහ ඉන්වෙන්ටරි පවත්වා නොතිබිණි. ශේෂ පත්‍රයේ දිනයේදී හෝ සමාලෝචිත වර්ෂය තුල වෙන යම් දිනයකදී වත්කම් ප්‍රත්‍යක්ෂව සත්‍යායනය කොට නොතිබිණි.

(ඇ) ගණක ලියවිලි සහ අභිලේඛන සකස්කිරීම සහ පවත්වා ගැනීම.

වියදම සහතික කල නිලධාරියා, මුදල් ගෙවීමට පෙර ගෙවීම් වවුචර් පත් නිරවද්‍යතා පරීක්ෂණයකට භාජනය කොට නොතිබිණි. වියදම සඳහා වූ අධිකාර බලය, මුදල් පොත් වල පත් ඉරු සහ ලැජරය පිළිබඳව, ගෙවීම් වවුචර් පත්වල සඳහන් කොට නොතිබිණි. වෙනත් අභිලේඛන නොබලා පහසුවෙන් පරීක්ෂා කිරීම් සඳහා, ඉන්වෙන්ටරි අයිතම් පිළිබඳ ගෙවීම් වවුචර්පත් වල ඉන්වෙන්ටරි සහතික අඩංගු නොවීය. ක්‍රියාවෘතපත්, භාණ්ඩ ලැබීම් සටහන් පත් සහ භාණ්ඩ නිකුත් කිරීම් සටහන් පත් වැනි ලියවිලි උපයෝජිතව නොතිබිණි. බොහෝ ගෙවීම් වවුචර් පත් වලට මුද්දර ගැසූ කුවිතාන්සි සම්බන්ධ කොට නොතිබිණි.

/ 8....

මුදල් ගනුදෙනු ලේඛනගත කිරීම සහ වර්ගීකරණය සඳහා නියි මුදල් පොතක් ප්‍රයෝජනයට ගෙන නොතිබිනි. වගකිවයුතු නිලධාරියෙකු විසින් බැංකු සැසැඳීම් ප්‍රකාශයන් නිවැරදි බවට සහතික කරනු ලැබ නොතිබිනි.

(ඈ) <u>උපචිත වියදම්:</u>

වර්ෂය අවසානයේ වූ උපචිත වියදම් ගිණුම් පොත් තිබිවක හෝ සටහන් නොකොට ආදායම් සහ වියදම් ගිණුමෙහි දක්වනු ලැබ තිබිනි. නියෝජ්‍යායතනයෙන් වර්ෂය අවසානයේදී වූ සියලුම ණය බැරකම් නිශ්චය කොට ගිණුම් ගත කල බවට සාක්ෂියක් නොවීය.

අ.ත./ඩබ්ලිව්.ගාමිණී ඇපා
විගණකාධිපති

<u>පිටපත්:-</u>

1. ධීවර අමාත්‍යාංශයේ ලේකම්.
2. මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්.

## ජාතික ජලජ සම්පත් නියෝජිතායතනය

### 1981 දෙසැම්බර් මස 31 දිනට ශේෂ පත්‍රය

| | | | | | |
|---|---|---|---|---|---|
| රජයේ දායක මුදල් | | 6,181,000.00 | ගෘහ භාණ්ඩ | | 17,730.00 |
| ආදායම් අතිරික්තය | | 235,067.01 | පොත් සහ සඟරා | | 1,560.00 |
| **ජංගම බැරකම්** | | | **ජංගම වත්කම්:** | | |
| ණය හිමියෝ | 4,110.00 | | ණය ගැතියන් (සේවක) | 14,600.00 | |
| උපචිත වියදම් | 141,726.79 | 145,836.79 | ණය ගැතියන් (සැපයුම්) | 46,875.00 | |
| | | | බැංකු ශේෂය | 6,479,078.40 | |
| | | | අත ඉතිරි මුදල් | 2,060.40 | 6,542,613.80 |
| | | 6,561,903.80 | | | 6,561,903.80 |

අ.ත./ආචාර්ය, හිරාන් ඩබ්ලිව්.ජයවර්ධන
සභාපති

අ.ත./ආචාර්ය,එස්.තේ.මහිල් පෙරේරා
අධ්‍යක්ෂක ජෙනරාල්

දිනය: 1984.01.05

## ජාතික ජලජ සම්පත් නියෝජිතායතනය

### 1981 ඔක්තෝම්බර් 16 සිට 1981 දෙසැම්බර් මස 31 දක්වා කාල පරිච්ඡේදය සඳහා ආදායම් වියදම් ගිණුම

| වියදම් | | ආදායම් | |
|---|---|---|---|
| පරිපාලන වියදම් | 474,610.74 | භාණ්ඩාගාර ලැබීම් | 953,000.00 |
| නඩත්තු සහ පොදු කාර්ය වියදම් | 230,374.75 | | |
| පාලක මණ්ඩල වියදම් | 12,947.50 | | |
| ආදායම් අතිරික්තය | 235,067.01 | | |
| | 953,000.00 | | 953,000.00 |

## විගණකාධිපති ගේ සහතිකය.

1981 සැප්තැම්බර් 16 වැනි දින සිට දෙසැම්බර් 31 වැනි දින දක්වා කල පරිච්ඡේදය සඳහා වූ ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වැනි වගන්තිය අනුව, කල මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මෙම ගිණුම් පිළිබඳ මාගේ නිරීක්ෂණයන් නියෝජිතායතනයේ සභාපති වරයා අමතන ලද සම දින දරණ මාගේ වාර්තාවේ සඳහන්ව ඇත.

අ.ක./ඩබ්ලිව්.ගාමිණී ඇපා
විගණකාධිපති

1984 මාර්තු 22 දින,
කොළඹ 7, විගණකාධිපති කාර්යාලයේ දීය.